## නිවේදනය අංක R/2026/09

## උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරු වලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අංක CP/DEC/25 දරණ 2025.02.27 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද 2025.02.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සමාංක දරණ 2025.07.16 දිනැති මගින් නිකුත් කරන ලද 2025.07.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරවත්, උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අංක NP/30/01/01/Recruit/Dept/01 දරණ 2026.03.16 දිනැති ඉල්ලීම ප්‍රකාරවත්, උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/04/01/Cad/DPCCS දරණ 2026.03.16 දිනැති නිර්දේශය සහ 2026.03.16 දිනැති ලිපි ප්‍රකාරවත්, උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ සමාංක දරණ 2026.02.26 දිනැති ලිපිය ප්‍රකාරවත්, ගරු ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක G/NPC/A8/Approval/2025/017 දරණ 2025.07.26 දිනැති ලිපියෙන් ලද ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ප්‍රකාරවත්, උතුරු පළාත් රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පහත **උපලේඛනය - I** හි දක්වා ඇති තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා විවෘත තරඟ විභාගයක් මගින් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව මෙම දැන්වීමේ සඳහන් සියලුම සුදුසුකම් සහිත අයදුම්කරුවන්හට මේ සඳහා අයදුම් කළ හැකිය. මෙම බඳවාගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2026 අප්‍රේල් මාසයේ දී** යාපනයේ දී පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2026.04.10** වේ.

- **උපලේඛනය - I**

| තනතුරු අංකය | විභාගයේ නම | පත්කරනු ලබන සේවක සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු |
| 01. | උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ **පාලක (පිරිමි/ ගැහැණු) (Matron) III ශ්‍රේණියට** බඳවා ගැනීමේ **විවෘත** තරඟ විභාගය - 2026 | 01 | 01 |
| 02. | උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ **නිවාස මාතා (House Mother) III ශ්‍රේණියට** බඳවා ගැනීමේ **විවෘත** තරඟ විභාගය - 2026 | - | 11 |
| 03. | උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ **සහකාර පාලක (පිරිමි/ගැහැණු) (Assistant Matron) III ශ්‍රේණියට** බඳවා ගැනීමේ **විවෘත** තරඟ විභාගය - 2026 | 01 | 03 |
| 04. | උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ **සහකාර නේවාසිකාගාර භාරකරු (පිරිමි/ගැහැණු) (Assistant Warden) III ශ්‍රේණියට** බඳවා ගැනීමේ **විවෘත** තරඟ විභාගය - 2026 | 01 | - |
| 05. | උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ **සහකාර නිවාසාචාර්ය (පිරිමි) (Assistant House Master) III ශ්‍රේණියට** බඳවා ගැනීමේ **විවෘත** තරඟ විභාගය - 2026 | 01 | - |

| | | | |
|---|---|---|---|
| 06. | උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ **සහකාර නිවාසාචාර්ය (ගැහැණු) (Assistant House Mistress) III ශ්‍රේණියට** බඳවා ගැනීමේ **විවෘත** තරඟ විභාගය - 2026 | - | 01 |
| 07. | උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ **වෘත්තීය උපදේශක (පිරිමි / ගැහැණු) (Vocational Instructor) III ශ්‍රේණියට** බඳවා ගැනීමේ **විවෘත** තරඟ විභාගය - 2026 | 01 | 01 |

**01.** **බඳවා ගැනීමේ සේවා කොන්දේසි**

01.1. 2025.07.07 වැනි දින සිට බලපැවැත්වෙන වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද ඉහත **උපලේඛනය - I හි දක්වා ඇති තනතුරුවලට** අදාළ සේවා ව්‍යවස්ථාවන්වල සඳහන් විධිවිධාන අනුව ද, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති අනුකූලව එක් එක් තනතුර සඳහා තෝරාගන්නා අයදුම්කරුවන් ඉහත සඳහන් තනතුරුවල **III ශ්‍රේණියට** බඳවා ගනු ලැබේ.

01.2. මෙම විභාගයෙන් සමත්වන, පත්වීමක් සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව **III වන ශ්‍රේණියට** පත්කරනු ලැබේ. මෙම සෑම තනතුරක්ම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරු වේ. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඉහත තනතුරුවල III වන ශ්‍රේණියට බඳවා ගත් දින සිට වසර 03 ක් ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුය.

01.3. මෙම සේවාවන් ස්ථානමාරුවලට යටත්වන සේවාවන් වේ. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් **"උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය"** යන කොන්දේසියට යටත් විය යුතුය

01.4. එක් එක් තනතුරට අදාළ පත්වීම් සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ. මෙම තනතුරුවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව **උපලේඛනය - I** හි දක්වා ඇත. කෙසේ වෙතත් නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

01.5. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුව පත්වීමේ දිනයේ සිට **වසර 03 ක්** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

**02.** **වැටුප් පරිමාණය**

අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, **MN 1-2025** අනුව **උපලේඛනය - I** හි දක්වා ඇති **III වන ශ්‍රේණියේ** තනතුරු සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු.45,230 -10 X 540 - 11 X 630 - 10 X 890 - 10 X 1,190 - 78,360** ක් වේ. (මෙම වැටුප් පරිමාණයේ සිව්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප් මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

**03.** **සාමාන්‍ය සුදුසුකම්**

03.1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

03.2. අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක තම තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීම හැකි යහපත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයෙන් හෙබි පුද්ගලයෙකු විය යුතු අතර මනා හැසිරීමකින් යුතු අයෙකු විය යුතුය.

03.3. අයදුම්කරු මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර හයක (06) කාලය තුළ අවම වශයෙන් නොකඩවා වසර තුනක (03) කාලයක් උතුරු පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා **ඡන්ද හිමි නාමලේඛනයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය)**

**හෝ**

අයදුම්කරු හෝ ඔහුගේ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර, උතුරු පළාතේ නොකඩවා වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචි අය විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා **ඡන්ද හිමි නාමලේඛනයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය)**

03.4. **වයස් සීමාව :-** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස **අවුරුදු 18** ට නොඅඩු සහ වයස **අවුරුදු 30** ට නොවැඩි විය යුතුය.

03.5. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර මෙම තනතුරට අදාළ **සියලුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

## 04. එක් එක් තනතුරුවලට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්

| තනතුරු අංකය | තනතුර | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| 01. | **පාලක (පිරිමි / ගැහැණු) (Matron)** | අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් **එක් වරක දී** දෙමළ/සිංහල සහ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අවම වශයෙන් විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.<br>**සහ**<br>අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් කුමන හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් එක් විෂයයක් සමත්ව තිබිය යුතුය.(සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | අයදුම්කරු ශ්‍රී ලංකා රජය විසින් පිළිගත් ආයතනයකින් අවම වශයෙන් මාස හයක (06) **“ළමා හා පුද්ගල රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා”** පාඨමාලාවක් සම්පූර්ණ කර තිබිය යුතුය. |
| 02. | **නිවාස මාතා (House Mother)** | | |
| 03. | **සහකාර පාලක (පිරිමි / ගැහැණු) (Assistant Matron)** | | |

<table>
<tr><td>04.</td><td>සහකාර නේවාසිකාගාර භාරකරු (පිරිමි/ගැහැණු) (Assistant Warden)</td><td rowspan="3">අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් එක් වරක දී දෙමළ/සිංහල සහ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අවම වශයෙන් විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.<br><br>සහ<br><br>අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් කුමන හෝ විෂයය ධාරාවකින් අවම වශයෙන් එක් විෂයයක් සමත්ව තිබිය යුතුය.(සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)</td><td rowspan="3">අවම වශයෙන් මාස හයක (06) " ළමා හා යෞවන රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා" සහතිකපත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබිය යුතුය.<br><br>සහ<br><br>අයදුම්කරු "පරිවාස ආයතනයක, ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හෝ බන්ධනාගාරයක" අවම වශයෙන් මාස 06 ක ළමා රැකවරණ හෝ සමාජ සුබසාධනය පිළිබඳ රාජකාරිවල නිරතවූ බවට සනාථ කෙරෙන සහතිකයක් ලබා තිබිය යුතුය.</td></tr>
<tr><td>05.</td><td>දෙපාර්තමේන්තුවේ සහකාර නිවාසාචාර්ය (පිරිමි) (Assistant House Master)</td></tr>
<tr><td>06.</td><td>සහකාර නිවාසාචාර්ය (ගැහැණු) (Assistant House Mistress)</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| 07. | **වෘත්තීය උපදේශක (පිරිමි/ගැහැණු) (Vocational Instructor)** | අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් **එක් වරක දී** දෙමළ/සිංහල සහ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අවම වශයෙන් විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.<br><br>**සහ**<br><br>අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් කුමන හෝ විෂයය ධාරාවකින් අවම වශයෙන් එක් විෂයයක් සමත්ව තිබිය යුතුය.(සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | අයදුම්කරු මෝටර් රථ තාක්ෂණ ශිල්පී **(Automobile Mechanic) ක්ෂේත්‍රයේ** රජයේ ආයතනයක හෝ ශ්‍රී ලංකා රජය විසින් පිළිගත් පෞද්ගලික ආයතනයකින් **වසරකට නොඅඩු වෘත්තීය පළපුරුද්ද** සනාථ කෙරෙන සහතිකයක් ලබා තිබිය යුතුය.<br><br>**සහ**<br><br>අයදුම්කරු රජයේ කාර්මික විද්‍යාලයක / ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (**NAITA**) / ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි ආයතනයකින් වසරකට නොඅඩු පූර්ණ කාලීන මෝටර් රථ තාක්ෂණ ශිල්පය පිළිබඳ වෘත්තීය පුහුණු පාඨමාලාවක් (NVQ Level - 4) සම්පූර්ණ කර තිබිය යුතුය. |

## **05.** බඳවා ගැනීමේ පරිපාටිය

05.1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සියල්ල අයදුම්කරු විසින් සපුරා තිබිය යුතු අතර, ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සියල්ලම පෙර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05.2. ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතරින් ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පත්කරනු ලබන කාණ්ඩ ගණන අනුව, ලබාගත් වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල (**Merit Order**) අනුව පත්වීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. තනතුරට අදාළ සුදුසුකම් සහ සුදුසුකම් සනාථ කෙරෙන ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බවට අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

## **06.** විභාග ගාස්තු

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස **රු.500/=** මුදලක් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට ලැබෙන පරිදි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ගෙවා, අදාළ ලදුපත අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## **07.** අයදුම්කිරීමේ පිළිවෙල

07.1. මෙම දැන්වීම සමග නිකුත් කරනු ලබන අයදුම්පත් අතරින්, තමන් අයදුම්කරන තනතුරට අදාළ අයදුම්පත බාගත කරගෙන, එය සම්පූර්ණ කර **අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමුකළ යුතුය.

07.2. එක් තනතුරකට වඩා ඉල්ලුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, විභාග ගාස්තුව ද වෙන් වෙන් වශයෙන් ගෙවා ලබාගත් කුවිතාන්සි අදාළ අයදුම්පත්වල අළවා එවිය යුතුය.

07.3. ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උපලේඛනය - I හි දක්වා ඇති පරිදි තමන් අයදුම්කරන විභාගයේ නම"** සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07.4. ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. කෙසේ වෙතත්, **විභාග ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

07.5. අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක. එසේ ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් පිළිබඳව අදාළ අයදුම්කරුවන් වෙත දන්වා යවනු ලැබේ.

07.6. ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර යොමු කළ පසු ඒ බව පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ. අදාළ දැන්වීම ප්‍රසිද්ධ කිරීමෙන් පසුව ද යම් අයදුම්කරුවෙකුට විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939** / ෆැක්ස් අංකය - **021-2219940** / විද්‍යුත් තැපැල - **examppscnp@gmail.com**)

- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්

- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපැලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ඇත්නම් මුදල් ඇණවුමේ සහතික කළ පිටපතක්

## 08. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කුමන හෝ ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ විභාගයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය.

## 09. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 10. අත්සන සහතික කිරීම

සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ. අයදුම්කරුවන් තම අත්සන කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්වයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.854,880.00 ට නොඅඩු මාසික වැටුපක් ලබන ස්ථිර රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරණ අයෙකු හෝ ලබා සහතික කරවා ගත යුතුය.

## 11. විභාග පරිපාටිය

මෙම ලිඛිත පරීක්ෂණය පහත දැක්වෙන පරිදි ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ. මෙම විභාගය දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. කෙසේ වෙතත් සුදුසුකම් සපුරන ලද සිංහල මාධ්‍ය අයදුම්පත් ඉදිරිපත් වුවහොත් සිංහල මාධ්‍යයෙන් ද විභාගය පවත්වනු ලැබේ. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| අනු අංකය | ප්‍රශ්න පත්‍රය | විෂයය අන්තර්ගතය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය (Intelligence Test) | මෙම ප්‍රශ්න පත්‍රය ගණිතමය හැකියාව (Arithmetic), තර්කානුකූල හැකියාව (Logical Reasoning), සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය (General Intelligence) පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විතය. | පැය 01 | 100 |
| 02 | භාෂා හැකියාව සහ සාමාන්‍ය දැනීම (Language Proficiency & General Knowledge) | සාරාංශ ලිවීම (Drawing of Conclusions), අවබෝධය (Comprehension), ගැටළු හඳුනා ගැනීම (Detection of Errors), ව්‍යාකරණ භාවිතය (Grammatical Usage) සහ තනතුර හා සම්බන්ධ ක්ෂේත්‍රය පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විතය. | පැය 01 ½ | 100 |

මෙම විභාගය තරඟ විභාගයක් වන හෙයින් පත්වීමක් සඳහා සුදුසුකම් ලැබීමට නම් එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක්වත් **40%** අපේක්ෂකයින් විසින් ලබාගත යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් ලබාගත් වැඩිම මුළු ලකුණුවල එකතුවේ අනුපිළිවෙල (Merit Order) සළකා බලනු ලැබේ.

## 12. විභාග ප්‍රතිඵල

විභාග ප්‍රතිඵල උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියෙහි පළකරනු ලබන අතර, තම තමන්ගේ පුද්ගලික විභාග ප්‍රතිඵල ද www.np.gov.lk ➝ **Exams & Recruitments** ➝ **Results** යන සබැඳිය මගින් බලාගැනීමටත්, භාගත කිරීමටත් හැකිය.

**සැළකිය යුතුය:-**

(i). මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

(ii). මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම පිළිබඳ සම්පූර්ණ බලය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සතුය.

(iii). මෙම නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

(iv). මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

(v). මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**ආල්වාප්පිල්ලෛ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2026.03.19**